මගේ අංකය: JSC/SEC/CIR – L/2023

සියලුම අධිකරණ නිලධාරීන් වෙත,

**<u>අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 270 ට අනුකූල නොවන පරිදි අධිකරණ වෛද්‍ය වාර්තා කැඳවීම</u>**

අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 270 ට අනුකූල නොවන පරිදි ඇතැම් මහේස්ත්‍රාත්වරුන් අධිකරණ වෛද්‍ය වාර්තා කැඳවා ඇති බවට අධිකරණ වෛද්‍ය නිලධාරීන් / විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරීන් වෙතින් ලැබී ඇති පැමිණිලි සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 270 ඔබගේ අවධානයට ලක් කරන ලෙසත්, වෛද්‍ය වාර්තා කැඳවීමේදී එහි සඳහන් පියවර අනුගමනය කරන ලෙසටත් ඔබට දැන්වීමට මට නියම කර ඇත.

02. ඒ අනුව, අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 270 මේ සමඟ අමුණා ඔබගේ අවධානයට ලක් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. එස්. සෝමරත්න

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2024 සැප්තැම්බර් මස 06 වෙනි දින,

කොළඹ 12,

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

1 JAN 2002

10 JAN 2002

මගේ අංකය: ජේ.444

අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 270

සියළුම අධිකරණ නිලධාරීන් වෙත.

අධිකරණ මගින් වෛද්‍ය වාර්තා ආදිය කැඳවීම සඳහා
<u>වෛද්‍යවරුන්ට ලිපි නිකුත් කිරීම</u>

අධිකරණ මගින් වෛද්‍ය වාර්තා ආදිය කැඳවීම සඳහා වෛද්‍ය නිලධාරීන්ට ලිපි නිකුත් කිරීමේදී අධිකරණය මගින් අපේක්ෂා කරනු ලබන්නේ කුමන කරුණක් අරභයා වූ වෛද්‍ය වාර්තාවක්ද යන්න සඳහන් කර නොමැති වීමෙන් , වෛද්‍ය නිලධාරීන් අපහසුතාවයට පත්වන බව සහ නඩු කටයුතු ප්‍රමාද වීම් සිදු වන අවස්ථා ගැන අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානය යොමු වී ඇත.

02. මේ අනුව එවැනි ලිපි නිකුත් කිරීමේදී පහත සඳහන් පියවර අනුගමනය කරන ලෙස ඔබට දැන්වීමට අධිකරණ සේවා කොමිෂන් සභාව මට නියම කොට ඇත.

I. වෛද්‍යවරයාගෙන් වාර්තාවක් අවශ්‍ය වන්නේ කුමන කරුණක් සම්බන්ධයෙන්ද යන්න හෝ වෛද්‍ය නිලධාරියාගේ අවධානයට යොමු කිරීම සුදුසුයයි හැඟෙන, අධිකරණය ඉදිරියේ විවාදයට භාජනය වී ඇති කරුණු හැකිතාක් දුරට පැහැදිලිව හා නිශ්චිතව ලිපියේ සඳහන් කළ යුතුය. සැකකරුවන් ආදී තැනැත්තන් වෛද්‍යවරයාට ඉදිරිපත් කර වාර්තාවක් කැඳවන ලෙස පමණක් ලිපියේ සඳහන් කිරීමෙන් අධිකරණයට නියත වශයෙන්ම දැන ගැනීමට අවශ්‍ය වන කරුණු වෛද්‍ය වාර්තාවේ සඳහන් නොවීමට ඉඩ ඇති නිසා , එකී වාර්තා කැඳවීම නිෂ්ඵල ක්‍රියාවක් විය හැකි වන අතර ඒ සඳහා ගතවන කාලය අපතේ යාමක්ද සිදු වේ.

II. හැකිතාක් දුරට වෛද්‍යවරුන්ට යොමුකරනු ලබන එකී ලිපි යතුරු ලියනය කර ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොවන අවස්ථාවේදී පැහැදිලි අකුරෙන් කියවීමට පහසු පරිදි සකස් කොට , දිනය යොදා තිබිය යුතුය.

III. වෛද්‍ය වාර්තාව ඉදිරිපත් කිරීමට යම් නිශ්චිත කාලසීමාවක් නියම කරන්නේ නම් එම කාලසීමාව අවස්ථානුකූල පරිදි අධිකරණය කල්පනා කරන සාධාරණ කාලසීමාවක් විය යුතුය.

IV. රාජකාරි ලිපි ගනුදෙනු වලට අදාල රීතීන්ට යටත්ව , ප්‍රස්තුත කාරණය විනීතව සහ අදහස් පැහැදිලිව ප්‍රකාශ වන පරිදි යොමු කළ යුතුය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

2001 දෙසැම්බර් මස 19 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.

පිටපත: ශ්‍රී ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය.

PA